# ශ්‍රී ලංකාවේ විවිධ ගිනි අවි සම්භවයට බලපෑ යුද උපක්‍රම පිළිබඳ විමර්ශනයක්.

*යූ.සී. ලත්හාරි [1]*

යුරෝපීයන්ගේ ආගමනයේ පටන් මෙරට රාජධානිවල විශාල පිරිස් බලයකින් යුත් යුද්ධ ශක්තියක් තිබුණ ද යුරෝපීයන්ගේ ගිනි අවි තාක්ෂණය ඊට අභියෝගයක් විය. එමෙන් ම උඩරට රාජධානියෙහි ආරක්ෂක යුද්ධ උපායන් භාවිතයෙන් තුවාලකරුවන් අවම කරගැනීමට ද ගිනි අවි භාවිත විය. එම නිසා මෙරට ගිනි අවි භාවිතයේ ආරම්භයත් ප්‍රචලිත වීමත් මෙසේ සිදු විය. ශ්‍රී ලංකාවේ විවිධ ගිනි අවි සම්භවයට බලපෑ යුද උපක්‍රම මොනවා ද යන පර්යේෂණ ගැටලුව මුල් ව සිදු වූ මෙම පර්යේෂණයේ අරමුණ මෙරට ගිනි අවි සම්භවය හා විකාශනය හරහා එවකට පැවති යුද්ධමය ස්වරූපය අතර සම්බන්ධය හඳුනාගැනීමයි. මෙහි දී යොදාගත් ක්‍රමවේදය වසයෙන් පුස්තකාල සහ අන්තර්ජාල පරිශීලනය භාවිතයට ගැනිණි. ලංකාවේ පැරණිතම තුවක්කුව කොඩිතුවක්කුව වේ. ඉන් ආරම්භ ව කාලතුවක්කු, දික් තුවක්කු, අත් තුවක්කු වැනි විවිධ ගිනි අවි යුධ බිමේ විවිධ අවශ්‍යතාවන්ට නිපදවීය. සැහැල්ලු ප්‍රහාරක කාලතුවක්කු වසයෙන් භාවිත කොඩිතුවක්කු පාබල හමුදාවේ ආධාරක ප්‍රහාර දියත් කිරීමටත් පහසුවෙන් නැවත එකලස් කළ හැකි බැවින් ගරිල්ලා සටන්හි දීත් වඩාත් උචිත විය. එසේ ම පෘතුගීසීන්ට එරෙහි ව සීතාවක රාජසිංහ දවස කැලණි ගං ඉවුරෙහි ස්ථාපිත ව තැබූ කාලතුවක්කු සතුරු සැපයුම් විනාශ කරලී ය. මෙරට පිරිසැකසුම් කළ විශේෂතම ගිනි අවිය වන දික් තුවක්කුවේ මුළු දිග අඩි හතකට වඩා වේ. සටන්වල දී තිරස් දිගු දුර වෙඩි තැබීම්, සතුරු හමුදාවේ අණදෙන නිලධාරී සහ වෙඩි බෙහෙත් රැගෙන යන්නා වැනි විශේෂිත ඉලක්කවලට පහර දීමට මෙය භාවිත වීය. එබැවින් සැඟ ව සිට පහර දීමේ වාසිය ලබා තිබේ. අඩි පහක් දිගින් යුත් සිංහල භේවායන්හට පොදුවේ ලබාදුන් අවසන් තුවක්කු වර්ගය අත් තුවක්කු ය. පාබල හමුදාවන් මුහුණට මුහුණ කරන සටන්හි දී මෙය භාවිතයට ගැණිනි. එමඟින් ඉදිරිපෙළ පාබල හමුදා ශක්තිමත් විය. මේ අනුව පෙනෙනුයේ ගිනි අවි භාවිතයත් සමඟ සිංහල හමුදාව යුරෝපීය යුධ තාක්ෂණයට මැනවින් අනුවර්තනය වූ බවයි. විශේෂිත කාර්යයන්ට පිරිසැකසුම් කළ තුවක්කු සැඟ ව සිට පහර දීමේ වාසියත් භූමියේ වාසියත් ගරිල්ලා උපක්‍රමයන්ගේ වාසියත් ලබාගත් නිසා යුද බිම නූතන යුද්ධ උපක්‍රමයන්ට සමපාත වන සේ පරිවර්තනය විය.

***ප්‍රමුඛ පද:*** ගිනි අවි, යටත් විජිත පාලන සමයේ සටන්, යුද්ධ තාක්ෂණය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. lathharic@gmail.com